# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2277/04 - 2022 අප්‍රේල් මස 25 වැනි සඳුදා - 2022.04.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 1/2012 (v).

**1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත**

1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වන වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ඩග්ලස් දේවානන්දා,
ධීවර අමාත්‍ය.

2022 අප්‍රේල් මස 22 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මෙම නියෝග 2022 නිල් පිහිණුම් කකුළුවන් ධීවර කළමනාකරණ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1996 නොවැම්බර් මස 07 වැනි දින අංක 948/25 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 1996 ධීවර මෙහෙයුම් නියෝගවලට අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන වලංගු මෙහෙයුම් බලපත්‍රයක් යටතේ හැර යම් තැනැත්තකු විසින් පතුළේ එළන කරමල් දැල් හෝ උගුල් යොදාගෙන ශ්‍රී ලංකා ජල තීරය තුළ නිල් පිහිණුම් කකුළුවන් ඇල්ලීමේ නිරත නොවිය යුතු ය.

3. යම් තැනැත්තකු විසින් නිල් පිහිණුම් කකුළුවන් ඇල්ලීමේ ධීවර මෙහෙයුම් සඳහා නයිලෝන් පොලිෆිලමන්ට් (බහු සූත්‍රිකා) දැල නොවන යම් දැලක් භාවිත නොකළ යුතු ය.

4. යම් තැනැත්තකු විසින්, නිල් පිහිණුම් කකුළුවන් ඇල්ලීමේ ධීවර මෙහෙයුම් සඳහා දැලෙහි ඇස අඟල් හතරයි දශම පහට (4.5) අඩු හෝ වෙළුව හයට (6) වැඩි පතුලේ එළන කරමල් දැල් භාවිත නොකළ යුතු ය.

5. යම් තැනැත්තකු විසින් ඒකක තෙත් බර ග්‍රෑම් සියයට (100) අඩු සජීවී හෝ අජීවී නිල් පිහිණුම් කකුළුවන් පිරිසැකසුම් කිරීම හෝ අපනයනය කිරීම සිදු නොකළ යුතු ය.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

6. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිත ආයතනයේ නිර්දේශවලට අනුව, අවශ්‍යතාවය මත හෝ සෑම වසර තුනකට වරක්ම වාර්ෂිකව නිකුත් කරනු ලබන බලපත්‍ර සංඛ්‍යාව සහ කකුළුවන් ඇල්ලීමේ මෙහෙයුම් පිරිවිතර නිශ්චය කරනු ලැබිය යුතු ය.

7. අමාත්‍යවරයා විසින්, අවශ්‍යතාවය අනුව හෝ සෑම වසර තුනකට වරක්ම, ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිත ආයතනයේ නිර්දේශය මත, 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 34 වගන්තිය යටතේ ඔහු විසින් සිදුකරනු ලබන දැන්වීමක් මගින් නිශ්චිතව දක්වනු ලබන ප්‍රදේශවල කකුළුවන් ඇල්ලීම සඳහා විවෘත කාල සහ සංවෘත කාල ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

8. යම් තැනැත්තකු විසින්, නිල් පිහිණුම් කකුළුවන් ඇල්ලීමේ ධීවර මෙහෙයුම් සඳහා පිටත සවිකරන ලද එන්ජිම සහිත ෆයිබර්ග්ලාස් යොදා වැරගැන්වූ ප්ලාස්ටික් බෝට්ටු (OFRP) හෝ යාන්ත්‍රික හෝ යාන්ත්‍රික නොවන සාම්ප්‍රදායික බෝට්ටු (MTRB හෝ NTRB) හැර වෙනත් කිසිදු වර්ගයක යාත්‍රාවක් භාවිත නොකළ යුතුය.

9. යම් තැනැත්තකු විසින් නිල් පිහිණුම් කකුළුවන් ඇල්ලීමේ ධීවර මෙහෙයුම් සිදු කිරීමේ දී මුහුදු පතුළ හෑරීමක් හෝ මුහුදු පතුළට හානියක් සිදු නොකළ යුතු ය.

10. නිල් පිහිණුම් කකුළුවන් ඇල්ලීමේ මෙහෙයුම් සඳහා වන බලපත්‍රලාභියකු විසින්, අධ්‍යක්ෂ - ජනරාල්වරයා විසින් නියම කරනු ලබන පරිදි නිෂ්පාදන දත්ත හා ධීවර මෙහෙයුම්වලට අදාළ වෙනත් යම් දත්ත ලබාදිය යුතු ය.

11. මේ නියෝගවල -

''අධ්‍යක්ෂ - ජනරාල්වරයා'' යන්නෙන්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා අදහස් වේ;

''පිරිසැකසුම් කිරීම'' යන්නෙන්, විකිණීම හෝ අපනයනය සඳහා සජීවී හෝ අජීවී කකුළුවන් තැම්බීම, බාහිර කවචය ඉවත් කිරීම, කරමල් හෝ අතුනුබහන් ඉවත් කිරීම, කැබලි කිරීම හෝ මාංශය ඉවත් කිරීම අදහස් වේ.

EOG 04-0163

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.